# tree *talks*

E.03
**Shaded Divinity**
Dr. Danister Perera

ලුණුගඟ උද්‍යාන සිය 75වැනි සංවත්සරය සමරන මොහොත හා සබැඳිව *Tree Talks* පෝඩ්කාස්ට් ප්‍රචාරය විසින් උද්‍යානයෙහි වැඩී ඇති තුරුලතා සහ පරිසර පද්ධති පිළිබඳව ගවේෂණය කරයි. වර්ෂ 1948 දී ශ්‍රී ලංකාව නිදහස ලබාගැනීමට පෙර මිලදීගන්නා ලද ලුණුගඟ, ජෙෆ්රි බාවාගේ පළමු සහ දිගුකාලීන ම වාස්තු විද්‍යාත්මක ප්‍රයත්නය යි. මෙම ජීවමාන ලේඛනාගාරයෙහි පවතින සංකීර්ණතා අනාවරණය කිරීමට අප හා එක්වන්න.

*Tree Talks* ප්‍රචාරය කෙරෙන කථාංග සඳහා අවශ්‍ය සියලු පිටපත්, පරිවර්තන සහ අතිරේඛ මාර්ගෝපදේශ *To Lunuganga* සහ Geoffrey Bawa යන වෙබ්අඩවිවලින් ලබාගත හැක. එම පෝඩ්කාස්ට්හි show notes වල ඒවා හා සබැඳි ලින්කු දක්වා ඇත.

Cinnamon Hillහි ඉතා ප්‍රවේශම් සහගතව සූක්ෂමව ස්ථානගත කර තිබෙන මූණමල් ගස, ප්‍රධාන නිවසේ සිට දේද්දූව වැව කරා අප නෙත් යොමවයි. දේද්දූව වැව ගූඪ ජනප්‍රවාද සඳහා ප්‍රකටය. එයින් වඩාත් සිත්ගන්නාසුලු දෙය වන්නේ, වැවේ ඇති හොන්දූව දූපතේ රුකක් මත්තෙහි වැඩවසන භික්ෂූන්වහන්සේ නමකගේ ආත්මය පිළිබඳව වන පුවතයි. පරම්පරාවෙන් පැවත එන කතාන්දරවලට බොහෝවිට සොබාදහම හා අන්තර් සබඳතා තිබිය හැකිය. මෙම කථාංගයේ දී, ආයුර්වේද විශේෂඥයෙකු සහ සංස්කෘතික මානව විද්‍යාඥයෙකු වන වෛද්‍ය ඩැනිස්ටර් පෙරේරා මහතා විසින් මූණමල් වැනි තුරුවල සංස්කෘතික හා අධ්‍යාත්මික කුතුහලය දනවන දෑ පිළිබඳව සොයාබලනු ලබයි.

මගේ නම ඩැනිස්ටර් පෙරේරා. මම අස්පර්ශනීය සංස්කෘතික උරුම පිළිබඳ විශේෂඥයෙක්. විශේෂයෙන්  ම, සාම්ප්‍රදායික දැනුම බහුලව පැතිර පවතින ප්‍රදේශවලත් ඒවා අක්‍රීය ප්‍රදේශවලත් එවැනි පුද්ගලයන් සමඟත් වැඩකරන කෙනෙක්. විශේෂයෙන් පිටිසරබද ප්‍රදේශවල. මගේ අධ්‍යයන ක්ෂේත්‍රයෙදි වැඩිපුර අවධානය යොමුවෙන්නේ, ශාකවල සංස්කෘතික සහ අධ්‍යාත්මික ප්‍රයෝජන සහ සාම්ප්‍රදායික ශාක පිළිබඳ කතාන්දර වෙතටයි. මිනිස්සුන්ගේ දැනුම වගේම, තුරු සහ ඒවායේ භාවිතයන් ගැන තොරතුරු බොහොමයක් සොයාගන්න පුළුවන් වන පරණ අත්පිටපත් කිහිපයක් එක්කත් මම වැඩ කරනවා. අපි ඒකට කියන්නෙ, ජනවාර්ගික විද්‍යාව කියලා.

ගස් කියන්නෙ, ස්පර්ශනීය වුණත් අස්පර්ශනීය වුණත්, සංස්කෘතික උරුමයේ කොටසක්. මොකද, ගස කියන්නෙ භෞතික වස්තුවක්. ඒක ස්පර්ශ කළ හැකි දෙයක් විදියට සලකන්න පුළුවන්. නමුත්, ගස් අස්පර්ශනීය උරුමයන් නිර්මාණය කරනවා. මොකද, ගස් අවට හෝ ඒ වාසස්ථානවල ජීවත්වන මිනිස්සු, තමන්ගේ සංස්කෘතික අස්පර්ශනීය උරුම පිළිබඳව සමහර විශ්වාස පද්ධති සහ ඒවායේ භාවිතයන් නිර්මාණය කරන නිසා.

අද මම කතාකරන්න යන්නෙ, ගස්වල සංස්කෘතික දෘෂ්ටිය වගේම ගස්වල සංස්කෘතික සහ අධ්‍යාත්මික සම්බන්ධයන් ගැන. අපි හැමෝම දන්නවා, ගස් කියන්නෙ සියවස් ගණනාවක පටන් සමාජයේ, සංස්කෘතියේ සහ ශිෂ්ටාචාරයේ ප්‍රධාන ම අංගයක් බව. සම්ප්‍රදායට අනුව අපි විශ්වාස කරනවා, ගස්වලට අධිපති රුක් දෙවිවරු ඔස්සේ එක්තරා විදියක දිව්‍යමය සම්බන්ධයක් ඒවාට තියෙනවා කියලා. ගස් කියන්නෙ දෙවිවරුන්ගේ විමාන කියලා. ඒනිසා, අපි ඒ අයව හඳුන්වන්නෙ රුක් දෙවිවරු කියලා, ගස්වල වැඩවෙසෙන එක්තරා විදියක දෙවිවරු වර්ගයක් කියලා. මිනිස්සු ගස් සැලකුවේ දිව්‍යමය ත්‍යාග හැටියට. ගස් කියන්නෙ සොබාදහමේ කොටසක්. ඒ වගේ ම ගස් සොබාදහම ආරක්ෂා කරනවා. සමහර වෙලාවට සොබාදහමේ පූජනීය ම දෙය විදියටත් ගස් හඳුන්වනවා. ගහකොළ කියන්නෙ ගෞරවනීය දෙයක්. පූජනීය දෙයක් ලෙසින් ගස් සලකලා බුහුමන් කරන්න සමහර සංස්කෘතික සහ අධ්‍යාත්මික හේතු මිනිස්සුන්ට තියෙනවා. භාරකාර දෙවිවරු පූජනීය තුරු අරඹවල්වල, පුණ්‍ය භූමි වන රක්ෂිතවල වැඩවාසය කරන බව මිනිස්සු විශ්වාස කරනවා. පුණ්‍ය භූමි වන රක්ෂිත කියන්නෙ ස්වාභාවිකවත් සාම්ප්‍රදායිකවත් ආරක්ෂිත ප්‍රදේශවලට. මේවාට ඇතුළුවෙන්න කලින් යම් යම් සීමාවන්ට සහ තහංචිවලට අනුගතවෙන්න මිනිස්සුන්ට සිද්ධවෙනවා. සාම්ප්‍රදායික වනාන්තර හෝ පුණ්‍ය භූමි රක්ෂිත එක්ක වැඩකරද්දි ඔවුන්ට යම් ආචාර ධර්ම කොටසක් පවතිනවා. මොකද, මිනිස්සු විශ්වාස කරනවා, වනාන්තර භූමි දෙවිවරුන්ගෙන් නැත්නම් දිව්‍යමය බලයකින් ආරක්ෂාවෙලා තියෙනවා කියලා. ඒනිසා, සමහර ගස් කපාදමන්න හෝ අලෙවිකරන්න තහනම්. ඒ ගහෙන් කොටසක් අරගන්න හෝ එළදාව නෙළන්න ඔබට වුවමනා නම්, ඒ වෙනුවෙන් ගහේ ඉන්න වෘක්ෂ දේවතාවාගෙන් ඔයාට අවසර ගන්න වෙනවා. ගස් කියන්නෙ පූජනීය ජීවීන් විදියට සලකලා ඓතිහාසිකව බුහුමන් කරන දෙයක්. එක්තරා විදියක ජීවීන් කොට්ඨාසයක්. මිනිස්සු ඒවා සලකන්නේ ජීවමාන අය විදියට. ඒනිසා, සමහර වෙලාවට මිනිස්සු ගස් එක්ක කතාකරන්න පුරුදුවෙලා ඉන්නවා. ගස්වලට පණ තියෙන බවත්, හිතන්න පුළුවන්ය කියලාත්, තමන්ට ආශිර්වාද කරන්න පුළුවන් බවත් මිනිස්සු හිතන්න පුරුදුවෙලා ඉන්නවා.  ගස් ජීවමානයි. ගස් කියන්නෙ මිනිස්සුන්ගේ ජීවිතවල කොටසක්.

සාමාන්‍යයෙන්, එදිනෙදා පරිහරණය වෙනුවෙන් ගස් වර්ග තෝරාගන්න මිනිස්සුන්ට ඔවුන්ගේ ම කියලා ආචාර ධර්ම පද්ධතියක් තියෙනවා. උදාහරණයක් විදියට, පූජනීය දේවල් වෙනුවෙන් වෙන්කළ ගස් කිහිපයක් තියෙනවා. ජ්‍යෝතිෂ්‍යයට අනුව ග්‍රහයන් නවදෙනෙක් ඉන්න බව අපි දන්නවා. ඒ ග්‍රහයො 9දෙනාට ම ගස් 9ක් බාරකරලා වෙන්කරලා තියෙනවා. සිංහල සහ දෙමළ අලුත් අවුරුද්දට හිස තෙල් ගාන නැකැතට, ඖෂධීය කොළපත් කිහිපයක් හිසටත් ඒවගේම දෙපතුලටත් තියෙනවා. ඒ දේ කරන්නෙ ගස්වලට තියෙන ඒ ග්‍රහතාරකා පිළිබඳ සංඥා අනුව. හැම ග්‍රහයෙක්ට ම ගහක් තියෙනවා. ඒ වගේම හැම සඳ කලාවක ම (moon mansion) කලා 27ක් පවතිනවා. ඒ හැම කලාවකට ම වෙන්වුණු ගස් තියෙනවා. ගස් සහ ගස්වල කොටස් සමහර චාරිත්‍ර සාර්ථකව සිදුකරගැනීමට පාවිච්චි කරනවා.

අපි දන්නවා ගස් සමඟ බැඳුණු සමහර ජනප්‍රවාද තියෙන බව. විශේෂයෙන් ගසක ආරම්භය ගැන. පාරම්පරික චාරිත්‍ර විධි අපි ළඟ තියෙනවා. ඔබ අහලා ඇති පොල් උපත, බුලත් උපත ඒ වගේ ම දෙහි උපත, තොලබෝ උපත ගැන. 'උපත' කියන්නෙ, ආරම්භ වුණු විදිය-සම්භවය වුණු හැටි යන අදහසයි. එතකොට 'පොල් උපත' කියන්නෙ 'පොල්ගෙඩිය හැදුණු හැටි' කියන තේරුමයි. පොල්ගෙඩිය ලෝකෙට ආවෙ කොහොමද කියන එක ගැන පසුබිම් කතාන්දරයක් තියෙනවා. මේ ආරම්භයත් එක්ක නිතරම වගේ, දිව්‍යමය නැතිනම් අධි-මානුෂීය සිදුවීමක් පවතිනවා. උදාහරණයක් විදියට, බුලත් නැත්නම් බුලත් කොළය සැලකෙන්නේ නාග ලෝකයෙන් පැමිණි බවටයි. ඒනිසා, ඒක හඳුන්වන්නේ 'අහිලතා' නමින්. අහිලතා කියන්නේ, 'සර්පයන්ගේ වැල' - 'සර්ප ලතා' යන අදහසිනුයි. ඒ අනුව, ගස් නාමකරණයත් එක්තරා ආකාරයක සංස්කෘතික මානයක් සහිත දෙයක් බව අපිට දැනගන්න පුළුවන්. ඔබ ගසක් නම්කරද්දී, ඒකට තේරුමක් තියෙනවා, ගහට කතාවක් තියෙනවා, ඒ පිටුපස පුරාවෘත්තයක් තියෙනවා.

ඒවගේම, ආගමික විශ්වාස සමඟ සම්බන්ධ වුණු ගස් තියෙනවා. අපි දන්නවා බෝ ගහ ගැන. එය *Ficus religiosa* කියන උද්භිත නමින් හඳුන්වනවා. උද්භිත නාමයේ කොටසක් සංස්කෘතික දෘෂ්ටිය එක්ක සම්බන්ධ වෙලා තියෙන බව ඔබට පෙනේවි. *Ficus religiosa* කියන නමේ *religiosa* කියන කොටසෙන් අදහස් කරන්නේ, ඒ ගස ආගමිකව භාවිත වන බව. එක් ආගමක විතරක් නෙමේ, බුදුදහම, හින්දු දහම වගේ ම ජෛන ආගම එක්කත් මේ ගහ සම්බන්ධයි. බුදුන් වහන්සේ බුද්ධත්වය ලැබූ බෝ ගස නැත්නම් පූජනීය වෘක්ෂය, පසුගිය ශතවර්ෂ ගණනාවක් පුරා බැතිමතුන්ගේ ගෞරව පුද සත්කාර ලැබුවා. එය ආශිර්වාදයේ සහ ආරක්ෂාවේ සංකේතයක් බවට පත්වී තියෙනවා. මේ අනුව, එආකාරයේ ගස් බොහොමයක් තියෙන බව අපිට දැකග න්න පුළුවන්. විශේෂයෙන් මහා විශාල ගස් සංස්කෘතීන් විසින් බොහොම ගරු කරලා සලකනු ලබනවා. අපි ඒවාට කේන්ද්‍රීය විශේෂයන් *(keystone species)* කියලා හඳුන්වනවා. එහි අදහස තමයි, ඒවා සංස්කෘතික වශයෙන් වගේම ජෛව විවිධත්වය අතිනුත් ඉතාම වැදගත් ගස් විශේෂයක් කියන එක. එක් විශාල ගසක් කියන්නෙ වෙනත් පොඩි තුරු සහ සත්ත්ව වර්ගවලට පහසුකම් සලසාදෙන ක්ෂුද්‍ර පරිසර පද්ධතියක් නිසා, මේ ගස් සොබාවික වාසස්ථාන සංරක්ෂණය වෙනුවෙන් ඉතා ම වැදගත් භූමිකාවක් ඉටුකරනවා. ඒක එක්තරා විදියක ක්ෂුද්‍ර පරිසර පද්ධතියක්. ඔබ මහා විශාල ගසක් දැක්කොත්, ඒ ගස මත රැඳී තියෙන වෙනත් බොහෝ අපි ශාක වර්ග, වෙනත් ශාක, වැල් වර්ග වගේම එයින් පෝෂණය ලබන කුරුල්ලන් සහ අනෙකුත් සත්ත්ව විශේෂ ඇතුළු සත්ත්ව විශේෂ ගණනාවක් ඔබට හොයාගන්න පුළුවන්. ඒනිසා මේ ශාක, මේ ගස්, විශාල වෘක්ෂ, ජෛව විවිධත්වය සංරක්ෂණය වෙනුවෙන් ඉතා ම තීරණාත්මක කාර්යයක් ඉටුකරන 'කේන්ද්‍රීය විශේෂයන්' ලෙසින් හඳුන්වනවා.

රුද්‍රාක්ෂ වගේ සමහර ගස් තියෙනවා. ඒ ගස්වලට කියන්නෙ 'ශිවප්‍රිය' කියලයි. ශිවප්‍රිය කියන නමින් අදහස් වෙන්නෙ ශිව දෙවියන්ව. මේ රුද්‍රාක්ෂ බීජය ඉතා ම ගෞරවාදරයට ලක්වූවක්. එක්තරා විදියක දිව්‍යමය බලයක් ඒකට තියෙන බව මිනිස්සු විශ්වාස කරනවා. ඒනිසා මේ එක් තනි ගස එක්ක විතරක් ම සම්බන්ධ වුණු බොහොමයක් විශ්වාස සහ බොහෝ ආගම් පවතිනවා. ඒ විදියටම, ඒ ඒ ගසට අදාළ වන සංස්කෘතික කතාන්දර සහ ආගමික සහ සංස්කෘතික භාවිතයන් අපට සොයාගන්න පුළුවන්. ඒවගේම, ඇතැම් ගස් දේව මණ්ඩලයකට අයත් දේපලක් විදියට සැලකෙනවා. උදාහරණයක් විදියට අපි බිල්වා ලෙසින් හඳුන්වන බෙලි ගස අරගන්න. බිල්වා ශිව දෙවියන්ට අයත් ගසක්. ඒ එක් පත්‍රිකාවක කොළ තුනක් තියෙනවා. ඒ කොළවල හැඩය, ශිවගේ ත්‍රිශූලය නියෝජනය කරනවා. ඒ විදියටම, ඔබට දැනගන්න පුළුවන්, සියලු ම ගස් ගැන මිනිස්සුන්ට තමන්ගේ ම අර්ථකථන, තමන්ගේම අවබෝධයක් සහ සංස්කෘතික හැඟීමක් ඇති බව. ගසේ හැඩය, සමහරවිට ගසේ ප්‍රයෝජන, තවත් වෙලාවකට ගසේ සුවඳ, ගසේ මල් වර්ගය, ගසක සියලු ම කොටස් ආදී ගහකට සම්බන්ධ වන සියල්ලට ම මිනිස්සුන්ට තියෙනවා තමන්ගේ ම සංස්කෘතික විස්තරයක්. ආයෙමත්, මම ජෛව විවිධත්වය ගැන කරුණ ඉස්මතු කරන්න ඕනෙ. ගස් සංස්කෘතික දෙයක් පමණක් නෙමේ. ඒවා සංස්කෘතික උරුමයන් නියෝජනය කරනවා විතරක් නෙමෙයි, ඒවාට ජෛව විවිධත්ව සන්දර්භයකුත් තියෙනවා. ඒක හරි වැදගත්. ගස් කියන්නේ සංස්කෘතික විවිධත්වයේ සංකේතයක්. ජෛව සංස්කෘතික විවිධත්වයේ අපේ උරුමයේ සංකේතයක්.

සංස්කෘතික මිනුම්වලදී, ගස් ගැන සමහර වැරදි හඳුනාගැනීම් තිබෙන බව අපි දැනගෙන ඉන්න ඕනෙ. හොඳම උදාහරණය තමා සල්ගස. බොහෝ ප්‍රදේශවල ඔබට සල්ගස් දකින්න ලැබෙනවා. හැබැයි සල් වෙනුවට අපිට තියෙන්නෙ Cannonball කියන ගස. උද්භිත විද්‍යාවට අනුව එය හඳුන්වන්නේ *Couroupita* නමින්. ඒ ගස, 18 වන සියවසේ අගභාගයේදී විතර බ්‍රිතාන්‍ය ජාතිකයන් භාවිතයට ගත්ත, දකුණු ඇමරිකානු ශාක විශේෂයක්. දැන් ඒක පූජනීය වෘක්ෂයක් වෙලා තියෙන්නේ මේ වැරදි වැටහීම නිසා. අපි ඒකට සල් ගහ කියලා කියනවා. ඒත්, ඇත්තම සල් කියන්නෙ *Shorea robusta* කියන ගස්වලට. මීට සියවසකට ඉස්සර, මේ ගස සල් ගහ විදියට වැරදියට හඳුනගත්ත හින්දා මිනිස්සු තාම විශ්වාස කරන්නේ මේ සල්ගහ කියලායි. Cannonball ගහ සල් ගහ කියලයි. ඒනිසා, ගස් සම්බධයෙන් නිවැරදි සංස්කෘතික උරුමය නැත්නම් සංස්කෘතික ඥානය තිබීම ඉතාම වැදගත්. ඒ මොකද, අස්පර්ශනීය සංස්කෘතික උරුමය ආරක්ෂා කරගන්න සැබෑ ම සම්ප්‍රේෂණයක් මගින් මේ දැනුම පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරන නිසා.

ලුණුගඟ ප්‍රදේශයේ දකින්න ලැබෙන ගස් ලැයිස්තුව දිගේ මම යනකොට, මට හමුවුණා *Couroupita* නැත්නම් cannonball ගසත්. සල් කියලා වැරදියට හඳුනගෙන ඉන්නෙ ඒ ගහයි. ඒහින්දා මම යෝජනා කරන්නෙ ඇත්ත ම සල් ගස වන *Shorea robusta* ගස මේ උද්‍යානයට හඳුන්වාදෙන්න කියලායි. ඒ දේ කරන්න පුළුවන් නම්, සල් ගහ ගැන යම් ආකාරයක අව්‍යාජ අදහසක් මිනිස්සු තුළ ඇතිකරගන්න ඒක වැදගත් වේවි.

ලුණුගඟ උද්‍යානයේ තියෙන විශේෂ ශාකවර්ග අතරින් එකක් තමයි මුණමල් ගස. මට අහන්න ලැබුණා මේ මුණමල් ගහ ඉතා ම විශේෂ වූ ගහක් කියලා මොකද, ජෙෆ්රි බාවා මහත්මයාගේ මූලික අවධානයට ලක් වුණු ගස් අතරින් එකක් වන හින්දා සහ ඔහු මේ ගහ ගැන ලොකු උනන්දුවක් දැක්වුව හින්දා. සංස්කෘත භාෂාවෙන් මුණමල් ගහ හඳුන්වන්නෙ බකුල ගස, බකුල නැත්නම් වකුල ගස කියලයි. *Mimusops elengi* යන නමින් උද්භිත විද්‍යානුකූලව එය හඳුන්වනවා. සංස්කෘතික වශයෙන් මුණමල් ගහ කියන්නෙ, හින්දු බැතිමතුන් අතර පූජනීය ශාකයක්. මුණමල් ගහේ හටගන්න සියුම් කෝමල ඉතාම සුවඳවත් මල් ගැන සංස්කෘත සාහිත්‍යයේ සඳහන් වෙනවා. විශේෂයෙන්, බෞද්ධ සාහිත්‍යය සහ හින්දු සාහිත්‍යය ඔස්සේ ගියොත්, වනාන්තර ගැන ඒ අය විස්තර කරන කතාන්දරවලදී, නිතරම වගේ සඳහන් කරනවා මල් පිපෙද්දි බොහොම තේජාන්විත සහ ඉතා ම අලංකාරව දකින්න ලැබෙන බකුල ගහ ගැන. අතීතයේ ඉඳන් ම ගෙවත්තේ තියෙන්න වුවමනා කළ විදියේ හොඳ ශාකයක් ඒක. ඒහින්දා, මුණමල් නැත්නම් බකුල සාහිත්‍ය වගේ ම ඉතිහාසය එක්කත් බැඳුණු, සංස්කෘතික වශයෙන් බොහොම වැදගත් ශාකයක්.

මේ ගස ක්‍රිෂ්ණා එක්ක සම්බන්ධයි. යමුනා නදී ඉවුරේ වෘන්දාවනයේ කිරි දාසියන් ගැන ක්‍රිෂ්ණා සිත් ඇදබැඳ තියාගෙන හිටියා කියලා කියනවා. කතාවට අනුව ඔහු සෙල්ලම් කරමින් හිටියෙ බකුල ගහක් යට. ඒනිසා එය ක්‍රිෂ්ණා හා බැඳුණු පූජනීය ගසක් බවට පත්වෙලා තිබෙනවා. සංස්කෘත සාහිත්‍යයේ, කාව්‍ය සාහිත්‍යයේ බහුල වශයෙන්, කතුවරු බකුල ගහ නැතිනම් මුණමල් ගස ආදරයේ සහ සුන්දරත්වයේ සංකේතයක් හැටියට විස්තර කරලා තියෙන්නේ, අලංකාර මල් නිසා. බකුල ගස රාමායණයේ, මහාභාරතයේ වගේම ජාතක කතා වගේ බෞද්ධ සාහිත්‍යයේත් ඔබට හොයාගන්න පුළුවනි. එක්තරා සන්දර්භයකදි, බකුල ගහ ත්‍රිමූර්තිය වෙනුවෙනුත් පූජනීය රුකක් බව සඳහන්. ත්‍රිමූර්ති කියන්නෙ බ්‍රහ්ම, විෂ්ණු සහ මහේෂ්වර කියන තිදෙනා. ඒ ත්‍රිමූර්තියේ සංකේතයක්. බකුල මල්වල තියෙනවා ඉතා ම මිහිරි ප්‍රබෝධමත් සුවඳක්. ඒනිසා කතාන්දරවල ආදරය ගැන සඳහන්වන සන්දර්භවලදි එය බහුලව සම්බන්ධ වෙනවා. ඉපැරණි කතාන්දරවල, විශේෂයෙන් ඉන්දියාවේ පුරාණ ඍෂිවරු මේ ගස් දෙවියන්ගෙන් ලැබුණු තෑගි විදියට සැලකුවා. එතකොට බකුල කියන්නෙ, එක්තරා විදියකින් වනාන්තරයට ලැබුණු දිව්‍යමය ත්‍යාගයක්. පන්සල් උයන්වල බකුල ගස් වැවිලා තියෙනවා නිතර හමුවෙනවා. පරණ පොත්වල පන්සල් උයන් ගැන විස්තර කරන බොහෝ අවස්ථාවලදි බකුල ගහ එහිම කොටසක්ව තියෙනවා.

බකුල ගස, සුභ ගසක් විදියට ගෙදර දකුණු පැත්තෙන් හිටුවන්න නියම කරලා තියෙනවා. දැන්

අපි දන්නවා ජෞතිෂ්‍යයට අනුව, ගෙදර හැම දිශාවකට ම සිටුවන්න නියමිත සුබ ගස් තියෙන බව. ඒ වගේ ම, අසුබ ගසුත් තියෙනවා. ඒනිසා වකුල කියන්නෙ, ගෙදරට පිවිසෙන තැන ම දොර ළඟ දකුණු පසින් සිටුවිය යුතු නැකැත් ගසක්. දකුණු පැත්ත කියන්නෙ පිරිමි කොටසයි. ඒනිසා බකුල කියන්නෙ පිරිමි ශාකයක්, පුරුෂරූපී ශාකයක්. මේ ශාකය සුබ අරමුණු සහිත කටයුතු වෙනුවෙන් දකුණු දිශාවට කැප කරලා තියෙනවා.

භාරතීය සාහිත්‍යයේ සඳහන් වන සෘෂිවරු බොහොමයක් දෙනා උයන්වල බකුලගස් යට වාඩිවෙලා හිටි ලෙසින් විස්තර කරලා තියෙන්නේ ඔවුන්ගේ බැතිමතුන් ඔවුන්ට ඇහුම්කන්දෙන්න ඒ බකුල ගස් යට හෙවණට ආ නිසායි. ඒනිසා ඒ අය විශ්වාස කළා, බකුල ගස් සෙවණ එක්තරා විදියක අධ්‍යාත්මික බලයක් ලබාදෙනවා කියලා. ස්වාභාවිකව ම ඒ හෙවණෙන් යම් විදියක අධ්‍යාත්මික සැනසීමක් ලැබෙනවා. ඒනිසායි සෘෂිවරු බකුල ගස් යට දේශනා පැවැත්තුවේ. බකුල් මල් ඉතාම සුගන්ධවත් නිසා, පැරණි සංස්කෘතියේ සබන් සහ සුවඳ විලවුන් වැනි ද්‍රව්‍ය හදන්න භාවිත කළා. රැජිනියන් මේ සුවඳට තදින් ආකර්ෂණය වුණා. මිහිරි සුවඳවත්බවට වශී වුණා. තමන්ගේ නිදන කාමර සහ අනෙකුත් ස්ථාන වඩාත් නැවුම් සහ ප්‍රබෝධමත් බවින් පුරවලා තියන්න ඔවුන් මේ මල් ඒ ඒ තැන්වල තියා තිබුණා.

ජ්‍යෝතිෂ්‍යයට අනුව, අපි දන්නවා චන්ද්‍ර කලා (moon mansion) නැතිනම් නක්ෂස්ත්‍ර 27ක් තියෙනවා කියලා. බකුල අයිතිවෙන්නේ අනුර නැකැතට. ලංකාවේ  සාම්ප්‍රදායික ශාන්තිකර්ම, සුවපත්කිරීමේ යාතුකර්ම චාරිත්‍රවිධිවලදි අපිට තියෙනවා එක යාතුකර්මයක්, අසූඑක්ගෙ බමල් බලිය *(asuekgebamal baliya)* කියලා. අසූඑක් කියන්නෙ, 81ට. ඒ චාරිත්‍රවිධියෙදි ඔබට කුටි 81ක් හමුවෙනවා. වකුල යොදාගන්නා මේ සුවපත් කිරීමේ යාතුකර්මවලට. ශාන්තිපෞස්තික යන්ත්‍රය*(shantipaustika)* ජපකරද්දි මූණමල් භාවිත කරනවා. ඉන්පස්සේ, ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ විවිධ ඖසු තෙල් වර්ගවලට නියම කරනවා.

සමාවෙන්න මම හැමතිස්සේම බකුල කියලා කියන්නෙ, මූණමල්වලට කියන සංස්කෘත වචනයයි. බකුල නැත්නම් වකුල. සමහරවෙලාවට ඒක සඳහන් වෙන්නෙ වකුල කියලා. බකුල, වකුල කියන්නෙ සමානව යෙදෙන වචන. මූණමල් ඖෂධීය බලපෑමක් කරන ශාකයකුත් වෙනවා. විවිධ ආකාරයේ ඖෂධීය නිෂ්පාදන වෙනුවෙන් මූණමල් භාවිත කරනවා. හින්දු සාහිත්‍යයේ පූජනීය වෘක්ෂ 36ක් තියෙනවා. මේ ගස ඒ අතරින් එකක්. කුබ්ජිකා තන්ත්‍රයේ *(Kubjika tantra)* සඳහන් වෙනවා,  එක්තරා විදියක අධ්‍යාත්මික බලයක් ලබාගැනීම වෙනුවෙන් බකුල මල භාවිත කරන බව. කුබ්ජිකා තන්ත්‍රය කියන්නෙ, ඉන්දියානු ග්‍රන්ථයක්. මිනිස්සු අධ්‍යාත්මික සැනසීම වෙනුවෙන් මල්, සුවඳ ද්‍රව්‍ය සහ සමහර භෞතික උපකරණ භාවිත කරමින් තාන්ත්‍රික පිළිවෙත් විධි එක්ක තමන්ගේ අධ්‍යාත්මික වර්ධනය ඇතිකරගැනීමට පුහුණුවන ග්‍රන්ථයක්. ඉතින් මේ බකුල කියන්නෙ, එහෙම පාවිච්චි කරන භෞතික දේවල් අතරින් එකක්.

මූණමල් ගහේ දැව පූජනීය කැටයම් සහ දේව රූප නිර්මාණය කරන්න භාවිත කරනවා. අපි ඒවා හඳුන්වන්නේ ප්‍රතිමා කියලා. මේ රූප හදන්න පාවිච්චි කරන පූජනීය දැවවර්ග අතරින් එකක් බකුල. ඒනිසා, බකුල නැත්නම් මූණමල් කියන්නෙ චෛතිය ගහක්. චෛතිය ගස් කියන්නෙ පූජනීයත්වයට පත්වුණු ගස් කියන අදහස. මම මීට කලින් කිව්වා, හින්දු ආගමේ පූජනීය වෘක්ෂ 36ක් තියෙන බව සහ ඒවා චෛතිය ගස් නමින් හඳුන්වන බව. චෛතිය කියන්නෙ, 'චෛත්‍යය' කියන අදහස. ඒකියන්නෙ, ආශිර්වාද ලබාගැනීම වෙනුවෙන් යම් යම් පූජාවර්ග සිදුකරන එක්තරා ආකාරයක විශාල ගස්වලට. හරියට අපේ බෝගස් වගේ. අපි ඒ පූජා විධි වෙනුවෙන් යොදාග න්න බෝ, නුග, නා කියන මේ වගේ විශාලගස්වලට තමයි චෛතිය ගස් කියල හඳුන්වන්නේ. බකුල කියන්නෙ ඒවායින් එකක්. ලාංකේය සංස්කෘතියේ තියෙනවා, බකුල පාවිච්චි කරලා හදන යම දේවරාජ තෛලය කියලා ඖෂධීය තෙලක්. මහා තෙයියෝරු තෛලය, මහා සරස්වතී තෛලය, රාජ සරස්වතී තෛලය කියන මේ ඖසු තෙල් වර්ගත් මූණමල් යොදාගෙනයි සාදන්නේ. මේ තෙල් වර්ග වගේම,  බොහොම ප්‍රබල ඖෂධයක් වන හෙනරාජ ගුලිය කියන බෙහෙත් පෙත්ත හදන්නත් මූණමල් පාවිච්චි කරනවා.

ඔබ සාහිත්‍ය වෙතට ගියොත්, මූණමල් කියන නම රුවන්මල්නිඝණ්ඩුව, අසදෘශ්‍ය ජාතක කාව්‍යය, සිංහල බෝධිවංශය, සිඛවළඳවිනිස, බෝධිවංස ගැටපදය, වෙසතුරු දා සන්නය, ජාතක අටුවා ගැටපදය, පූජාවලිය, ධර්මප්‍රදීපිකාව, සද්ධර්මරත්නාවලිය, දළදා සිරිත, කව්සිළුමිණ, සිංහල ජාතක පොත, සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාකරය, පරෙවි සන්දේශය, කොවුල් සන්දේශය, කහකුරුලු සන්දේශය, මහරූප සිද්ධිසන්නය, රොහොත්සංහිඳ, නාරද සන්හිත, වාස්තු රත්නාවලිය වැනි බොහෝ සාහිත්‍ය මූලාශ්‍රවලින් හොයාගන්න ලැබේවි. මූණමල් කියන නම සහ එහි භාවිතයන් සාහිත්‍යයෙන් සොයාගත හැකි එක්තරා විදියක පොත් ලැයිස්තුවයි මේ. මේ ගහ හරි ම සිතග න්නාසුලු ගහක්. අපේ සංස්කෘතියේ වගේ ම ගම්වල සාම්ප්‍රදායික සමාජය ඇතුළෙදිත් හරිම ප්‍රයෝජනවත් ගසක්. මේ ගස බහුඅර්ථ, බහු-කාර්ය ගසක් ලෙසින් සලකනවා. ඒ මොකද මිනිස්සුන්ට තමන්ගේ එදිනෙදා ජීවිතයෙදි සොබාවික ශාක ප්‍රයෝජනයට ගන්නා විදිය ගැන තමන්ගේ ම කියලා නුවණක් තියෙනවා.

ඒහින්දා, මේ ස්පර්ශනීය සහ අස්පර්ශනීය කියන දෙක අතර සම්බන්ධය අවබෝධ කරගන්න එක හරිම වැදගත්. මොකද අපිට ඒ වර්ග දෙක වෙන්කරන්න බැහැ. බෙදලා වෙන් වෙන් වශයෙන් අරගන්නත් බැහැ. මොකද ඒවා එකිනෙකා මත අන්තර් වශයෙන් රඳා පවතින නිසා, එකිනෙකාගෙ න් යැපෙන නිසා.

අදාළ වස්තුව එතැනින් ඉවත් කළොත් ඒ සම්පූර්ණ සංස්කෘතිය ම අතුරුදහන් වේවි. සංවර්ධන මැදිහත්වීම් නිසා, ප්‍රශ්න ගණනාවකට මුහුණදෙන වර්තමාන සමාජයේ දි අපිට තියෙන ඉතා ම තීරණාත්මක අභියෝගයක් ඒක. සංස්කෘතිය ගැන කිසි හැඟීමක් දැනීමක් නැති සංවර්ධන මැදිහත්වීම් එක්ක සමහරවෙලාවට සංවර්ධනයෙන් සංස්කෘතිය නැසී වියැකී යනවා. සංවර්ධනයට සංස්කෘතිය ගැන හැඟීමක් නැහැ. සංවර්ධනය සංස්කෘතික බලපෑම මැන බලන්නේ නැහැ. සාමාන්‍යයෙන් අපි දන්නවා, බොහෝ සංවර්ධන ව්‍යාපෘති 'පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරු ඇගයීම්' කියලා දෙයක් කරනවා. ඒත් ඔවුන් 'සංස්කෘතික බලපෑම් පිළිබඳ ඇගයීම්' කියලා දෙයක් කරන්නේ නැහැ. ඒ අය ඇත්තටම සංස්කෘතිය ගැන තැකීමක් කරන්නේ නැහැ. ඒකයි හේතුව.

ඒ මොකද කියනවා නම්, විශේෂයෙන් පිටිසරබද ප්‍රදේශවල, හැම ගම්මානයකම වගේ, මුළු ලංකාව පුරාම පාහේ, මහ දැවැන්ත ගස් 10ත් 15ත් අතර ප්‍රමාණයක් තියෙනවා. ඒ ගම්වල මිනිස්සු ඒ ගසට යම් පූජා සහ වත්පිළිවෙත් කරනවා. එතකොට ඒ වගේ සංස්කෘතික වස්තුවක් ඉවත්කරන එක උරුමයට ඇතිකරන්නේ අහිතකර බලපෑමක්. ඒනිසායි අපි තේරුම්ගන්න ඕනෙ ස්පර්ශනීය සහ අස්පර්ශනීය සංස්කෘතික උරුම කියලා බෙදීමක් නැති බව. ඒහින්දා, අපිට ස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරකින්න වුවමනා නම්, ඒ එක්ක බැඳුණු අස්පර්ශනීය සංස්කෘතික උරුමයත් අපිට ආරක්ෂා කළ යුතු වෙනවා.

සොබාදහම තමා විසින් ම නිර්මාණය කළ සැලැස්මක් තුළ පරිසර පද්ධති නිර්මාණය කරගෙන තියෙනවා. සොබාවික සන්දර්භය ගැන නිසි අවබෝධයක් නැතිව සොබාදහමේ මොනයම් හෝ හසුරුවාලීමක් කරනකොට, මිනිස්සු බොහොම පරිස්සම් වෙන්න ඕනෙ ඒනිසයි.

අපිට ගස් ගැන හැඟීමක් දැනීමක් හෝ සංස්කෘතික ගෞරවයක් තියෙන්න ඕනෙ. ගස්වලට ඒ වගේ ගෞරවයක් දැක්විය යුතුය කියන අදහස අපි ප්‍රවර්ධනය කරන්න ඕනෙ. ඒනිසායි ඉපැරණි සමාජවල දි වනාන්තරත් එක්ක ජීවත්වුණු මිනිස්සු 'හරිත ආගම්' බහුලව අනුගමනය කළේ. හරිත ආගම්, ඒ අය නිතරම ගස්වලට පණ ඇති ජීවීන් ලෙසින් බුහුමන් කළා. ඒ අය හිතුවා ගස්වලටත් හිතන්න පුළුවන් බව සහ ගස්වලට තමන් සමඟ සන්නිවේදනය කරන්න පුළුවන් බව. ඒක එක්තරා යල්පැනපු අදහසක් කියලා, ගස් සහ ගල් වන්දනා නොකළ යුතු දේවල්ය කියලා සමහරවිට මිනිස්සු හිතන්න පුළුවන්. ඒක එක්තරා විදියක බොහොම ප්‍රාථමික භාවිතයක්. නමුත් මට නම් ඒක එහෙම දෙයක් නෙමෙයි.

ගස් සිටුවීම ගැන නවීන හෝ වර්තමාන ක්‍රම දිහා බැලුවොත්, ඒක එක්තරා විදියක බොහොම කෘතිම දෙයක්. සමහරවිට අපි සොබාදහමට විදෙස් ශාක විශේෂ හඳුන්වාදෙනවා. ඒහින්දා, අපි මුලින් ම අපේ ම සොබාවය තේරුම් අරගෙන, ඒ පරිසරයට උචිත ජීවී විශේෂ බොහොම කල්පනාවෙන් තෝරාගන්න ඕනෙ. අපි නුපුරුදු ජීවී විශේෂ හඳුන්වාදිය යුතු නැහැ. අනෙකුත් විශේෂ එක්ක අන්තර් සම්බන්ධතා තියෙන ජීවී විශේෂ අපි හඳුන්වා දෙන්න ඕනෙ.

ජෙෆ්රි බාවා තමන්ගේ ගෙවත්ත වෙනුවෙන් භාවිත කළ සංකල්පය බොහොම සොබා හිතකාමී එකක් කියලා මම හිතනවා. ඔහුගේ අරමුණ වුණේ, එක්තරා විදියක කැලෑබද පරිසරයක් නිර්මාණය කරන එකයි. කැලෑබද නැතිනම් වනාන්තර පරිසරයක් කියලා කියන්නෙ, ජීවී විශේෂ අතර ඔබ අන්තර් සම්බන්ධතාවක් පවත්වගෙන යන සොබාවික පරිසරයකටයි. ගස් කියන්නේ පණ ඇති ජීවින් බව අමතක කරන්න එපා.

ඒනිසා, උද්‍යානයක එක්තරා විදියකින් ගස් සමූහයක් තිබීම හරි වැදගත්. අතනින් මෙතනින් හුදෙකලා වුණු තනි ගස් විතරක් නෙමේ, ඒ ගස් සේරම එකට තියෙන, ගස් සතුටු වෙන විදියෙ එක්තරා ආකාරයක ආශිර්වාදාත්මක පරිසරයක් සකස් කරන එක අතිශය වැදගත්. අමතක කරන්න එපා එයාලාටත් හැඟීම් දැනීම් තියෙනවා කියලා. ඒහින්දා, ඔවුන්ට ඔවුන්ගේ ම අන්තර් ක්‍රියා ඇතිවෙන්න ඔබ ඉඩදෙනවා නම්, ඒ අය සතුටු වේවි. ඔබ පරිසරය සතුටු කළොත්, පරිසරය ඔබට ආශිර්වාද කරාවි. ඒනිසා, සොබාදහම එක්ක ජීවත්වෙන එක, ගහකොළ එක්ක ජීවත්වෙන එක, පරිසරය එක්ක ජීවත්වෙන එක කලාවක්. ඔබ ඒ කලාව දැනගෙන ඉන්න ඕනෙ. එතනදි මුලින් ම  ගස් පණ ඇති ජීවින් හැටියට පිළිගන්න ඕනෙ. ඉන්පස්සෙ, ඒ අයගේ ජීවන තත්වයන්, ප්‍රමිතීන්වලටත් ඔබ ගරුකරන්න ඕනෙ.

*Tree Talks* වෙත සවන්දීම පිළිබඳව ඔබට ස්තූතියි. මෙම පෝඩ්කාස්ට්හි හිමිකම ජෙෆ්රි බාවා භාරය සතුය. සියලුම හිමිකම් ඇවිරිණි. සියලු ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය  පටිගත කිරීම් Geoffrey Bawa Curatorial සමූහය විසින් අදාළ ස්ථාන වෙත ගොස් ලබාගන්නා ලදී. මේ සම්බන්ධයෙන් ඔබට යම් ප්‍රශ්නයක් හෝ අදහසක් තිබේ නම්, කරුණාකර assistant.curator@gbtrust.net ඔස්සේ අප හා සම්බන්ධ වන්න. ඔබේ අදහස් දැනගැනීමට අපි කැමැත්තෙන් සිටිමු.

GEOFFREY BAWA TRUST